# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,092 — 1960 මාර්තු 25 වැනි සිකුරාද — 25.3.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි)


## IV වැනි කොටස – පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 69 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| නනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | මාර්ග කොමිටි දන්වීම් ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දන්වීම් ... ... ... | — | විවිධ දන්වීම් ... ... | 69 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ජී.ඞී—ජීසී. 14/27.

### 1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබඳ ආඥාපනත

වර්ෂ 1952ක් වූ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබඳ ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර ගම් ප්‍රදේශයේ ගම් කායඹ සභාව විසින සම්මත කරගන්නාලද පහත දක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළ කරනු ලැබේ :—

යෝජනාව

ප්‍රදේශ පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලද්දාවූද සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව වර්ෂ 1953 ක්වූ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදන යෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1, 2, 3, 5, 6, 9, 10, 11, 12, 14, 18, 19, 21, 22, 23, 25, 26, 27, 28, 29, 31, 32, 33, 34, 35, 36 සහ 37 දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට පොතුහැර ගම් ප්‍රදේශයේ ගම් කායඹ සභාව විසින් වර්ෂ 1952ක්වූ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබඳ ආඥාපනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ඩී. කළුහෙන්දිවල,
පොතුහැර ගම්කායඹ සභාවේ ප්‍රධානතැන.

1959ක්වූ දෙසැම්බර් මස 5 වැනි දින දීය.

## විවිධ දන්වීම්

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ගම්කායඹ සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1960 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ගම්කායඹ සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

ඩී. ඇම්. ජයතිලක,
පන්නල ගම්කායඹ සභාපති.

පන්නල ගම්සභා කායඹාලය,
යක්විල, 1960. 3. 10.

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| සූ. ඇල්. ඒ. රහීම්, බම්මන්න, බම්මන්න | නාරන්ගොඩ | හරක් මස් |
| ඇම්. ඒ. සලීන්, බම්මන්න, කැළණියමුල්ල | නාරන්ගොඩ | හරක් මස් |

# විශේෂ නිවේදනයයි

1960 අප්‍රේල් 13 වැනි බදාදා සහ අප්‍රේල් 15 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1960 අප්‍රේල් මාසයේ තුන්වැනි සුමානයේ ගැසට් පත්‍රය, 1960 අප්‍රේල් 14 වැනි බ්‍රහස්පතින්දා නිකුත් කරන බැවින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 අප්‍රේල් 8 වැනි සිකුරාදා පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 මාර්තු 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.